# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2224/4 - 2021 අප්‍රේල් මස 19 වැනි සඳුදා - 2021.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ලුණුවත්ත ජල සම්පාදන ක්‍රමයේ ගබඩා ටැංකිය (දැනට භාවිතා කරන) සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2021 අප්‍රේල් මස 06 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
යොමු අංකය : 5/2/3/1533.

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 41 B, ලුණුවත්ත ග්‍රාම නිලධාරී වසමේ ගිනිකටුගල ගමේ පිහිටි, මේ සමග එවන දල සැලැස්මේ දැක්වෙන ගිනිකටුගල ඉඩම නැමති සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 30 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : පුද්ගලික ඉඩම ටී. ඒ. කුසුම්සිරි මහතා ;
*නැගෙනහිරට* : පුද්ගලික ඉඩම ඩබ්. එම්. ටී. ඩී. විජේසිංහ මහතා ;
*දකුණට* : ප්‍රධාන පාර ;
*බටහිරට* : පුද්ගලික ඉඩම ඩබ්. එම්. ටී. ඩී. විජේසිංහ මහතා.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

04 - 811

1A - G 34197 — 47 (2021/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කොලොන්න - බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය II වන අදියර යටතේ ජල ගබඩා ටැංකිය, පොම්පාගාරය හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2021 අප්‍රේල් මස 06 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිමැටිතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හොප්වෙල්වත්ත ගමේ පිහිටි, වලගාව අරාවේ හේන නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 60 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : කැබලි අංක 03 ;
*බටහිරට* : මාර්ගය.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. ඒ. වී. බස්නායක මහතා,
88/1, බාන්ස් රත්වත්ත මාවත,
බලංගොඩ.

04 - 812